# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1689/14 - 2011 ජනවාරි 20 වැනි බ්‍රහස්පතින්දා - 2011.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස — පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 04 දරන ඌව පළාතේ, සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව 2010 දෙසැම්බර් 24 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2010 ජනවාරි මස 05 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

1A - PG 001219 — 345 (2011/01)

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 04 දරන ඌව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය

ඌව පළාත තුළ වෙසෙන ජනතාවට සාධාරණ සහ යුක්ති සහගත සමුපකාර සේවාවක් ලබා දීම ඌව පළාතේ පළාත් සභාවේ වගකීම වන බැවින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වැනි සංශෝධනය මගින් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාත තුළ කාර්යක්ෂම හා ඵලදායී සමුපකාර ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව සමුපකාර ව්‍යාපාරයේ නියැලී සිටින සේවකයින් සහ නිලධාරීන් පත් කිරීම, උසස් කිරීම, සේවයෙන් පහ කිරීම, විනය පාලනය කිරීම, වැටුප් හා දීමනා ගෙවීම, පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙලක් ඇති කිරීම සඳහාත් ඊට ආනුෂංගික වූ කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතට සහ එයට සිදු කරන ලද සංශෝධන වලට අනනුකූල වේ.

*පූර්විකාව*

කාර්යක්ෂම, ඵලදායි හා විශ්වසනීය වූ යහපත් සමුපකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යාම තුළින් ඌව පළාතේ ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය ඉහල නැංවීමට ඌව පළාතේ පළාත් සභාව බැඳී සිටින හෙයින්,

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

*ලුහුඬු නාමය*

1. මෙම ප්‍රඥප්තිය 2010 අංක 04 දරන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ක්‍රියාත්මක වන දිනය*

2. මෙම ප්‍රඥප්තිය මෙහි මින් මතු "ආණ්ඩුකාරවරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ, අනුමැතිය ලැබුණු දිනක සිට හෝ ආණ්ඩුකාරවරයා විසින් නියම කරන ලද දිනක සිට වලංගු වන්නේය.

### I වැනි කොටස

### ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය, එහි බලතල හා කාර්යයන්

*ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව සංස්ථාපනය*

3. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා මින් මතුවට "කොමිෂන් සභාව" යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටවනු ලැබේ.

*නීතිගත සංස්ථාවක් විය යුතු බව*

4. කොමිෂන් සභාව අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නෛතික සංස්ථාගත තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරනු ලැබීමට හැකි විය යුතු අතර මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය සියලු දේ කිරීමට ද, බලය ඇති නීතිගත සංස්ථාවක් විය යුතුය.

*කොමිෂන් සභාවේ සංයුතිය*

5. (1) කොමිෂන් සභාව මෙහි මින් මතු "අමාත්‍යවරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාත් සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(2) යම් තැනැත්තකු ,

(අ) සමුපකාර සමිති සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු වේ නම් හෝ,

(ආ) අමාත්‍යවරයාගේ මතය අනුව සමුපකාර සේවකයින් ගේ වැටුප් , වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීමේ අරමුණ වශයෙන් පවත්වා ගෙන යනු ලබන සේවක වෘත්තීය සමිතියක සාමාජිකයෙකු සිටින තැනැත්තෙකු වේ නම් හෝ,

(ඇ) සමුපකාර සමිති නීතිය අනුව සමුපකාර සමිතියක දැනට ධූරය දරන නිලධාරියෙකු හෝ ධූරය දැරූ නිලධාරියෙකු වන යම් තැනැත්තකු වේ නම් හෝ,

(ඈ) සිහි විකල් තැනැත්තෙකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තෙකු හෝ දණ්ඩ නීති සංග්‍රහය යටතේ නැතහොත් අල්ලස් පනත යටතේ වරදකරුවකු බවට අධිකරණය විසින් තීරණය කරනු ලැබ සිටින අයෙකු වේ නම් හෝ,

(ඉ) තත්කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු හෝ වශයෙන් ධූර දරන තැනැත්තෙකු වේ නම් හෝ,

(ඊ) සමුපකාර සමිතියක හා සමුපකාර සේවකයෙකු වෙනුවෙන් නීති කටයුතු සම්බන්ධව පෙනී සිටි හෝ පෙනී සිටින නීති නියෝජිතයෙකු හෝ විනය පරීක්ෂණ නිලධාරියෙකු හෝ අභියාචනා පරීක්ෂණ නිලධාරියෙකු වේ නම් හෝ,

(උ) සමුපකාර විෂය හා සම්බන්ධ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවේ සේවය කරන අයෙකු වේ නම් හෝ,

ඒ තැනැත්තා එකී කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට හෝ තවදුරටත් එහි කටයුතු කිරීමට නුසුදුස්සෙකු විය යුතුය.

(3) සමුපකාර සේවක කොමිෂන් සභාවට පත් කරනු ලබන සාමාජිකයන් අතරින් දෙදෙනෙකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ලැබූ මාණ්ඩලික මට්ටමේ තනතුරු දැරූ නිලධාරීන් විය යුතුය. එසේම එක් අයෙකු සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුමක් ඇති අයෙකු විය යුත්තේය.

6. (1) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකුම අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිතාක් හෝ උපරිම වසර තුනක කාලයක් ධුර දැරිය යුතුය. සාමාජිකයින්ගේ නිල කාලය

(2) කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ සාමාජිකයින් සියලු දෙනා හෝ ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමට අමාත්‍යවරයාට හැකිය.

(3) යම් සාමාජිකයකු ඉල්ලා අස්වීමෙන් හෝ මිය යාමෙන් හෝ අමාත්‍යවරයා විසින් කලින් ඉවත් කිරීමක් හෝ ඉහත 5(2) උප වගන්තිය පරිදි නුසුදුස්සකු වීමෙන් හෝ ඇතිවන පුරප්පාඩුවක් සඳහා නැවත අයෙකු පත් කිරීමට අමාත්‍යවරයාට හැකියාව ඇති අතර එසේ පත් කරනු ලබන සාමාජිකයා හෝ සාමාජිකයින් කලින් සිටි සාමාජිකයා හෝ සාමාජිකයන්ගේ ධූර කාලයෙන් ඉතිරිව ඇති කාලය සඳහා පමණක් ධූර දැරිය යුත්තේය.

(4) වරක් කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අයෙකු නැවත එහි සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හැකිය.

7. (1) අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් අතරින් එක් අයෙකු එහි සභාපතිවරයා වශයෙන් නම් කළ යුතුය. සභාපතිවරයා පැමිණ සිටින සෑම අවස්ථාවකදීම ඔහු කොමිෂන් සභා රැස්වීම් වල මුලසුන දැරිය යුතුය. සභාපතිවරයා නොපැමිණි විටදී පැමිණ සිටින සාමාජිකයන් අතරින් එක් අයෙකු විසින් රැස්වීමේ මුලසුන ගත හැකිය. සභාපති හා කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාම

(2) කොමිෂන් සභා රැස්වීම් වල ගණ පූර්ණය සඳහා එහි සාමාජිකයින් දෙදෙනෙකු පැමිණ සිටීම ප්‍රමාණවත් වේ.

(3) සාමාජිකයින් දෙදෙනෙකු පමණක් පැමිණ සිටින අවස්ථාවක දී යම් කරුණක් පිළිබඳව තීරණයක් ගත නොහැකි වූ විටක ඒ කරුණ කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමකට ඉදිරිපත් කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තිදෙනාම පැමිණ සිටින රැස්වීමක දී යම් කරුණක් පිළිබඳව ගත යුතු තීරණය සම්බන්ධයෙන් ඒ සාමාජිකයින් අතර වන මතය වෙනස් වන්නේ නම් වැඩි දෙනාගේ මතයට අනුව තීරණයකට එළඹිය යුතුය. එහෙත් සාමාජිකයින් සමානව බෙදුනහොත් සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමි වේ.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතීම නිසා හෝ පත් කිරීම සම්බන්ධයෙන් වන අඩු පාඩුවක් නිසා හෝ ඒ කරුණ හේතුකොට ගෙන කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ හෝ කරනු ලබන නියෝග හා විධිවිධාන කිසිවක් අවලංගු නොවිය යුතුය. නැතහොත් අවලංගු වන්නා සේ නොසැලකිය යුත්තේය.

(6) මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කළ හැකිය.

8. ඌව පළාතේ පළාත් සභාවේ මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව කොමිෂන් සභාවේ සභාපතිට සහ එහි සාමාජිකයින්ට ගෙවිය යුතු පාරිශ්‍රමික සහ දීමනා අමාත්‍යවරයා විසින් නියම කළ යුතු වන්නේය. සාමාජිකයින්ට පාරිශ්‍රමික ගෙවීම්

9. (1) කොමිෂන් සභාවට ලේකම්වරයෙකු සිටිය යුතු අතර, ඔහු හෝ ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පංතියට නොඅඩු ජ්‍යෙෂ්ඨතාවයක් ඇති නිලධාරියෙකු විය යුතුය. ලේකම් හා අන්‍ය නිලධාරීන්

(2) කොමිෂන් සභාවේ සෙසු කාර්ය මණ්ඩලය පළාත් රාජ්‍ය සේවකයින් අතරින් පත් කර ගත යුතුය.

10. (1) කොමිෂන් සභාවේ සභාපති සහ සාමාජිකයින් ලෙස පත් කරනු ලැබූ තැනැත්තන් විසින් ස්වකීය ධූරයේ කාර්යයන් ආරම්භ කිරීමට මත්තෙන් ඌව පළාතේ මහාධිකරණයක විනිශ්චයකාරවරයෙකු ඉදිරියේ මෙම ප්‍රඥප්තියේ සඳහන් උපලේඛන අංක 01 ප්‍රකාරව දිවුරුම් හෝ ප්‍රතිඥා දිය යුතුය. කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධාරීන්ගේ නිල දිවුරුම්

(2) ලේකම් හා කාර්ය මණ්ඩලයේ සෙසු නිලධාරීන් කොමිෂන් සභාවේ සභාපතිවරයා ඉදිරියේ මෙම ප්‍රඥප්තියේ සඳහන් උප ලේඛන අංක 02 ප්‍රකාරව දිවුරුම් හෝ ප්‍රතිඥා දිය යුතුය.

11. කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුය. කොමිෂන් සභාවේ බලතල

(1) සමුපකාර සමිතිවල සියලුම සේවකයින් බඳවා ගැනීම හා උසස් කිරීමට අදාළ සේවා කොන්දේසි හා මූලධර්ම ඇතුළත් කාර්ය පරිපාටි නියම කිරීම.

(2) අවශ්‍ය විටක සමුපකාර සමිති සේවකයින් බඳවා ගැනීමට අදාළ විභාග පැවැත්වීම හා එබඳු විභාග පැවැත්වීමේ මණ්ඩල නම් කිරීම හා එබඳු විභාග සඳහා වන ගාස්තු නියම කිරීම.

(3) සමුපකාර සමිතියක ඕනෑම තනතුරකට පත් කිරීම සඳහා තිබිය යුතු සුදුසුකම් නියම කිරීම, ඕනෑම පන්තියක හෝ ශ්‍රේණියක තනතුරකට හෝ තනතුරුවලට අදාළ වැටුප් ක්‍රම නියම කිරීම කලින් කලට එසේ නියම කළ වැටුප් ක්‍රම සංශෝධනය කිරීම, එමෙන්ම කොමසාරිස්වරයා විමසා එබඳු කරුණු පිළිබඳව තීරණය කිරීම.

(4) කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙසට සමුපකාර සමිති වලට නියම කිරීම.

(5) සමුපකාර සමිති විසින් සිය සේවකයන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටි නිශ්චය කිරීම, ඒවා පැවැත්වීම සඳහා බලතල නියම කිරීම හා නියම කරනු ලබන කාල සීමාවන් ඇතුළත දී විනය පරීක්ෂණයක් පවත්වා අවසන් කරන ලෙස සමිති වලට දැනුම් දීම.

(6) ඕනෑම සමුපකාර සමිතියක් විසින් ගනු ලබන විනයානුකූල නියමයන් හේතු කොට ගෙන පැන නගින අභියාචනා විභාග කිරීම.

(7) සිය සේවකයන් පිළිබඳව සමුපකාර සමිතිය විසින් තබා ගත යුතු වාර්තා කවරේදැයි නියම කිරීම.

(8) ඕනෑම සේවකයෙකු පිලිබඳව කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපි ගොනු, වෙනත් ලේඛන හා විස්තර වාර්තා නියමිත දිනකට කලින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සහ සපයන ලෙස ඕනෑම සමිතියකට නියම කිරීම.

(9) කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා නිර්දේශ සහිතව කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට අභියාචනා පරීක්ෂණ නිලධාරි හෝ නිලධාරී මණ්ඩල පත් කිරීම.

(10) තමාගේ ක්‍රියා කලාපය විනය පරීක්ෂණ විෂය කාරණයක්ව පවතින යම් සමිතියක ඕනෑම සේවකයකු විසින් එම සමිතිය දුන් විනය නියෝගයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනා කොට ඇති අවස්ථාවක එවැනි අභියාචනයක් සලකා බලා සමිතිය විසින් කරන ලද තීරණය වෙනස් කිරීමට, ලිහිල් කිරීමට, අවලංගු කිරීමට හෝ ඒ වෙනුවට වෙනත් තීරණයක් ලබාදීමට හෝ නැවත පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග කිරීමට හෝ එවැනි සේවකයෙකු නැවත සේවයට ගැනීම ඇතුළුව කොමිෂන් සභාව විසින් දෙනු ලබන නියෝග හා ඒවායේ සඳහන් වන ආකාරයට හා දිනක දී නැතහොත් නියම කරනු ලබන දිනකට පූර්වයෙන් ක්‍රියාත්මක කරන ලෙසට සමුපකාර සමිතියකට නියෝග කිරීම.

(11) විනය කාර්යයක් නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ සේවකයෙකු ගේ සේවය අවසන් කිරීමක දී අවශ්‍ය වන්නේ නම් පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ සේවකයින්ට ලබා දීම පිළිබඳව ප්‍රතිපත්ති තීරණය කිරීම.

(12) අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසි මගින් නියම කරනු ලබන යම් මුදලක් තැන්පත් කරන ලෙස අභියාචනාකරුට නියම කිරීමට සහ අභියාචනා පරීක්ෂණය අවසානයේ දී එකී තැන්පත් මුදල රදවා ගැනීමට හෝ ආපසු ගෙවීමට තීරණය කිරීම.

(13) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීමේ දී යම් සමුපාකාර සමිතියක් හෝ යම් පන්තියක සමුපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් විමසා ඇමතිවරයාට උපදෙස් දීම.

(14) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි සමුපකාර සමිති වලට හා ඒවායේ සේවකයින්ට අදාළ වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(15) ඉහත (6) සහ (12) යන උප වගන්ති වලින් කොමිෂන් සභාව වෙත පැවරෙන බලතල ක්‍රියාවෙහි යෙදීමේ දී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ වල හෝ නියෝග කිරීම් වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කොමිෂන් සභාවට කල හැකිය.

මූල්‍ය ප්‍රතිපාදන

12. සමුපකාර සේවක කොමිෂන් සභාවේ කාර්යයන් සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන වාර්ෂික හෝ පරිපූරක අයවැය ලේඛන මගින් පළාත් සභාව විසින් වෙනස් කර දිය යුතුය.

අරමුදලක් පිහිටුවීම

13. (1) අභියාචනකරුවන් ගේ තැන්පත් මුදලින් අරමුදලක් පිහිටුවිය හැකිය. මෙකී අරමුදලට ඉහත 11 වගන්තියේ (12) උපවගන්තියේ සඳහන් තැන්පත් මුදල් බැර කල හැකිය. මෙම අරමුදලේ කළමණාකාරිත්වය කොමිෂන් සභාව සතුය.

(2) මෙම අරමුදල පාලනය කිරීම සඳහා කාරක රීති සකස් කර ඇමතිවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය.

*II කොටස*

*සමුපකාර සමිති හා ඒවායේ කාර්ය මණ්ඩලය*

14. යම් සේවකයෙකු වෙනුවෙන් වැටුප් හෝ වෙනක් පඩිනඩි ගෙවනු ලබන සමුපකාර සමිතියක් එම සේවකයාගේ සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතුය. සමුපකාර සමිතියක් සේවා යෝජකයෙකු විය යුතු බව

15. සෑම සමුපකාර සමිතියක්ම එහි අරමුදලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් හා අනිකුත් දීමනා ගෙවිය යුතුය. සමුපකාර සමිති සේවකයින්ගේ වැටුප්

16. ඕනෑම සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුව ද, මෙම ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි නියෝගයන්ට යටත් විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ බලතල ඉටු කිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහිලා කෙරෙන කොමිෂන් සභාවේ සියලු නියෝගයන් හා 11 වගන්තියේ (15) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කරනු ලබන නියමයන් අවසානාත්මක විය යුතු අතර, එකී සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ නියමයන් පිළිපැදීමට බැඳී සිටිය යුතුය. සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ නියෝගයන්ට යටත්විය යුතු බව

17. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියලු නියෝග 11 වගන්තියේ (15) උපවගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ නියෝග සමිතිය විසින් කරන ලද්දක් පරිද්දෙන් ඒ සේවකයා විසින් පිළිපැදීමට බැඳී සිටිය යුතුය. කොමිෂන් සභාවේ නියෝගවලින් සමුපකාර සේවකයින් බැඳෙන බව

18. මෙම ප්‍රඥප්තිය යටතේ ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවන දිනට හෝ ඊට පෙර 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත හා එයට කරන ලද සංශෝධන අනුව ප්‍රතිස්ථාපිත සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ද, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනත අනුව ඌව පළාත් සමුපකාර විෂයභාර අමාත්‍යවරයා සහ ඔහු විසින් පත් කරනු ලැබූ පළාත් සමුපකාර කොමිෂන් සභාව විසින් ද, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරන ලද 1991 අංක 05 දරන ඌව පළාත් සමුපකාර සමිති සහ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය හා ඊට අදාල සංශෝධන යටතේ ස්ථාපිත කරන ලද ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ද, ඌව පළාත් සමුපකාර සමිති හා සේවකයින් විෂයෙහි ක්‍රියාත්මක වන පරිදි:- මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට හා ඊට පෙර කරන ලද ක්‍රියාවන් වලංගු කිරීම

(1) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුලු සියලු වර්ග කිරීම්,

(2) 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ කාර්යයන් ඉටු කිරීමෙහිලා නිකුත් කරන ලද සියලු ආකාරයේ විධානයන්,

(3) භාර ගන්නා ලද සියලු ආකාරයේ අභියාචනා, විභාග කිරීම ආරම්භ කරන ලද හා විභාග නිම කොට නියෝග නිකුත් කළ සියලු අභියාචනා,

(4) පනවන ලද සියලු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානයන්, සහ

(5) කරන ලද සියලුම පත් කිරීම් හා උසස් කිරීම්

මෙම ප්‍රඥප්තිය යටතේ සිදු කරනු ලැබූ පරිද්දෙන් නීතිමය බලය සහිතව වලංගුව බලපැවැත්විය යුතුය.

19. සමුපකාර සමිතියක ඕනෑම තනතුරක් සඳහා බඳවාගත හැක්කේ ඌව පළාත ඇතුළත වසර 2කට වැඩි ස්ථිර පදිංචියක් ඇති තැනැත්තෙකු පමණි. එසේ වුව ද කොමිෂන් සභාවේ මතය අනුව යම් සමුපකාර සමිතියක එවැනි තනතුරක් සඳහා සුදුසුකම් ඇති අයෙකු ඌව පළාත ඇතුළතින් තෝරා ගැනීමට අපහසු වුවහොත් අමාත්‍යවරයා විසින් සාදන ලද රෙගුලාසිවල සඳහන් නියමයන්ට යටත්ව සමිතිය විසින් එකී කොමිෂන් සභාවට දැන්වීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ අනුමැතිය මත එම පළාත තුළ ස්ථිර පදිංචිය නොමැති වුව ද සුදුසුකම් ඇති අයෙකු පත් කර ගැනීමට සමුපකාර සමිතියකට බලය තිබිය යුතුය. පදිංචිය පිළිබඳ සුදුසුකම්

20. සමුපකාර සමිතියක යම් තනතුරකට පත් කරනු ලබන ඕනෑම තැනැත්තෙකු එම තනතුරට අදාල වූ වැටුප් ක්‍රමයක පිහිටුවිය යුතුය. එය 25(1) උපවගන්තියේ සඳහන් ආකාරයට සමිතියේ වර්ගයට අනුව නිශ්චය කරනු ලබන සේවක වර්ගයට සහ පන්තියට අදාල පරිදි තීරණය විය යුතුය. සමුපකාර සමිතියක වර්ගය අනුව සහ සේවකයින්ගේ වර්ගය හා පන්තිය අනුව සේවක වැටුප් ක්‍රම නිශ්චය කළ යුතු බව

21. මෙම ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද පත් කිරීමේ බලධරයාගේ එකඟත්වය සහ අදාල නිලධාරියාගේ ද සමිතියේ ද කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතීයනය කරන ලද නිලධාරියෙකු සමිතියක යම් තනතුරකට කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාල සීමාවකට නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව පත් කිරීමට කොමිෂන් සභාවට හැකිය. මෙම වගන්තියේ කාර්යයන් සඳහා පත් කිරීමේ බලධාරියා යනුවෙන් අදහස් කරනුයේ ඌව පළාත් රාජ්‍ය සේවයේ පත් කිරීමේ බලධාරියා වේ. ඌව පළාත් රාජ්‍ය සේවයෙන් ද්විතියනය කිරීම

සමුපකාර සේවකයින් සේවයෙන් පහකිරීම සහ දඬුවම් කිරීම

22. (1) යම් සමුපකාර සමිතියක් විසින් තම සේවකයෙකු සේවයෙන් පහකිරීමට හෝ අන්‍යාකාරයක දඬුවමක් කිරීමට මෙම ප්‍රඥප්තිය යටතේ සලසා ඇති ආකාරයට හෝ ඒ යටතේ සාදන ලද රෙගුලාසිවලට අනුව මිස නොකළ යුතුය.

(2) මේ වගන්තියේ සඳහන් විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදු වූ නැතහොත් උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩ කිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමුපකාර සමිතියක සේවකයෙකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීම මෙම ප්‍රඥප්තියේ විධිවිධාන අනුව පවත්වාගෙන යාමට හා අවසන් කිරීමට බාධාවක් නොතිබිය යුතුය.

(3) කිසියම් සමුපකාර සමිතියක් විසින් විධිමත් පරිදි විනයානුකූලව කටයුතු කිරීමකින් තොරව කිසියම් සේවකයෙකුට දඬුවම් නියම කිරීමට එරෙහිව එම සේවකයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක දී හෝ ඊට සම්බන්ධ නීති කෘත්‍යයක දී සේවකයාට වන්දි, හිඟ වැටුප්, දඩ මුදල් හෝ වෙනත් මුදලක් සමිතියෙන් ගෙවීමට සිදු වුවහොත් එම දඬුවම නියම කිරීමේ තීරණය ගනු ලැබූ කාරක සභාවේ සභාපති ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් විසින් තනි තනිව හෝ එකමුතුව එකී මුදල සමිතියට ප්‍රතිපූරණය කිරීමේ වගකීමක බැඳී සිටිය යුතුය. මෙම මුදල් ඌව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය අනුව අයකර ගත හැකිය.

සේවකයින්ට අදාල රෙගුලාසි

23 (1) පහත සඳහන් ආකාරයේ එනම්-

(අ) සමුපකාර සමිතිවල සේවකයින් වර්ග කිරීම් ශ්‍රේණි හා පන්ති නියම කිරීම්, බඳවා ගැනීම්, පත් කිරීම්, උසස් කිරීම්, මාරු කිරීම්, ඉල්ලා අස්වීම් සහ සේවය අවසන් කිරීම පිළිබඳව,

(ආ) සේවකයින්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා සේවකයින්ට වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික ගෙවීම් අත්තිකාරම් ප්‍රදානයන්, නිවාඩු, විනය ක්‍රියාවලිය හා අභියාචනා පිළිබඳ සහ සේවා නියමයන් හා කොන්දේසිවලට අදාල, හා

(ඇ) අවශ්‍ය වෙතැයි සැලකෙන වෙනත් කරුණු පිළිබඳව,

අමාත්‍යවරයා විසින් රෙගුලාසි සාදනු ලැබිය හැක.

(2) ඌව පළාත් සභා බල සීමාව තුල පිහිටි සියලුම සමුපකාර සමිති සහ ඒවායේ සේවකයින් මෙහි (1) වැනි උපවගන්තියේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම රෙගුලාසියකින්ම බැඳී සිටිය යුතුය.

සිය සේවකයින් සම්බන්ධ සමුපකාර සමිතිවල කාර්ය භාරයන්

24. (1) සෑම සමුපකාර සමිතියක් විසින්ම-

(අ) එහි සෑම සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ලේඛන හා වාර්තා තබා ගත යුතු අතර, එක් එක් සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ආකාරයට අදාල අවශ්‍ය සියලුම විස්තර ඒවායෙහි ඇතුලත් කළ යුතුය ;

(ආ) කොමිෂන් සභාව විසින් සේවකයින් පිළිබඳව සැපයිය යුතු යැයි නියම කරනු ලැබිය හැකි වාර්තා හා තොරතුරු සහ විටින් විට කොමිෂන් සභාවට අවශ්‍ය වෙතැයි නියම කරනු ලැබිය හැකි ආකාරයට තොරතුරු සැපයිය යුතුය;

(ඇ) එම සමිතිවල කාර්යාලවලින් යම් කාර්යාලයකට ඇතුලු වී එහි පවත්වාගෙන යනු ලබන පොත් පත් ගිණුම් වාර්තා හා ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට හා ඒවායේ පිටපත් ලබා ගැනීමට ද ඒ සඳහා බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ සාමාජිකයෙකුට හෝ නිලධාරියෙකුට ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්ගේ පූර්ව අනුමැතිය ඇතිව ද, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුට ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව ද එසේ කිරීමට ද ඉඩ දිය යුතුය.

## *III කොටස*

### *කොමසාරිස්වරයාගේ බලතල*

කොමසාරිස්වරයා විසින් සමිති වර්ග කල යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළ යුතු බව

25. (1) සමුපකාර සමිතිවල සේවක තනතුරු වෙනුවෙන් වැටුප් ක්‍රම නියම කිරීම සඳහා සමුපකාර සමිති වර්ග කිරීමට ද ඒ සමිතිවල සේවක වර්ග හා පන්ති සහ එක් එක් වර්ගයේ හා පන්තියේ සිටිය යුතු සේවකයින්ගේ සංඛ්‍යාව නියම කිරීම හා අවශ්‍ය වෙතැයි තමා සලකන පරිදි විටින් විට වෙනස්කම් කිරීමේ බලය කොමසාරිස්වරයාට තිබිය යුතුය.

(2) ඉහත (1) උපවගන්තිය අනුව කොමසාරිස්වරයා විසින් කරනු ලබන නියමයකට පටහැනි වන පරිදි කිසිම සමුපකාර සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට බඳවා ගැනීම නොකළ යුතුය.

26. කොමිෂන් සභාව විසින් සමුපකාර සමිතිවල යම් තනතුරකට පත් කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ද යම් පන්තියක හෝ යම් ශ්‍රේණියක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ වැටුප් ක්‍රම නියම කිරීම ද ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතුය.

සුදුසුකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගත යුතු බව

### *IV කොටස*

### *විවිධ කරුණු*

27. (1) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී එමගින් විධිවිධාන සලස්වා නොමැති හෝ සාර්ථක විධිවිධාන සලස්වා නොමැති හෝ කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවයක් හෝ උද්ගත වුවහොත් අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝගයන් මගින් ඒ දුෂ්කරතාවය හෝ සැකය ඉවත් කළ හැකිය. නැතහොත් තීරණය කළ හැකිය. එවැනි නියෝගයක් *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසුව ඊට නීතිමය බලය තිබිය යුතු අතරම මෙම ප්‍රඥප්තියේ පනවනු ලැබුවාක් මෙන් වලංගුව හා බලාත්මකව පැවතිය යුතුය.

දුෂ්කරතා ඉවත් කිරීම

(2) ස්වකීය කාර්ය පරිපාටි සකස් කර ගැනීම පිළිබඳ ඉහත සඳහන් කරුණුවලින් ආවරණය නොවන්නාවූ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවශ්‍ය වන විධිවිධාන සකස් කර ගැනීමට කොමිෂන් සභාවට බලය ඇත්තේය.

28. (1) ප්‍රකාශිතව අන් ආකාරයක විධිවිධාන සලස්වන ලද්දේ නම් මිස නියෝග සෑදීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ඒ සියලු කරුණු සහ නියම කළ යුතු යැයි මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශ කර හෝ නියම කර ඇති සියලු කරුණු සඳහා වූ නියෝග ඇතුළුව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති බල ගැන්වීම සඳහා අවශ්‍ය වන කොමිෂන් සභාවට පැනවිය හැකි සියලු නියෝග කොමිෂන් සභාව විසින් සෑදිය හැකිය.

අමාත්‍යවරයා විසින් රෙගුලාසි පැනවිය හැකි බව

(2) එවැනි කිසිම නියෝගයක් අමාත්‍යවරයා විසින් එය අනුමත කරනු ලබන තුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයෙහි* පළකරනු ලබන තුරු බලනොපැවැත්විය යුතුය. එය පළකරනු ලැබූ දිනය හෝ නියෝගයෙහි නිශ්චිත යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) (1) වැනි උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක්ම එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමැතිය සඳහා ඌව පළාත් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම නියෝගය කළ දින සිට එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන ලද දිනය පිළිබඳ නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතුය.

29. ගන්නා ලද තීරණයක් හෝ කරන ලද හෝ නොකරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකුට කොමිෂන් සභාවේ සාමාජික තත්ත්වයෙන් ඒ තැනැත්තාට හෝ නීතිගත සංස්ථා තත්ත්වයෙන් කොමිෂන් සභාවට හෝ විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යයක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

නෛතික ආරක්ෂාව

30. මෙම ප්‍රඥප්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද යම් සමුපකාර සමිතියක් එහි කාර්යක්ෂමතාව උදෙසා-

(1) කොමිෂන් සභාවේ පූර්ව අනුමැති ඇතිව ගිවිසුම් පදනමින් නිශ්චිත සේවා කොන්දේසිවලට අනුකූලව ප්‍රවීණයකු හෝ විශේෂඥයෙකු සේවයට බඳවා ගත හැකිය.

*නැතහොත්*

(2) අනියම් හෝ දවස් පඩි හෝ පැය පඩි ගෙවන සේවකයින් හෝ කෑලි ක්‍රමයට ගෙවන සේවකයින් සේවයෙහි යොදවා ගත හැකිය. එසේ වුව ද කොමිෂන් සභාවේ එකඟත්වය නැතිව එවැනි සේවකයින්ට සේවා ස්ථිරත්වයක් ලබා නොදිය යුතුය.

31. (1) *(අ)* මෙම ප්‍රඥප්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ,

වැරදි

*(ආ)* කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන යම් කාර්යයක් ඕනෑකමින් නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ මෙම ප්‍රඥප්තියේ අවශ්‍යතාවන්ට අනුව කොමිෂන් සභාවට හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන්‍ය තැනැත්තෙකුට හෝ සපයන ලෙස නියම කරනු ලබන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින්ම නොසලකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින හෝ,

*(ඇ)* අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කරන හෝ

යම් සමුපකාර සමිතියක් හෝ කාරක සභාවක් හෝ යම් නිලධාරියෙකු හෝ යම් සේවකයෙකු හෝ මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

2. ඉහත (1) වැනි උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම සමූපකාර සමිතියක් හෝ සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු. 5,000 කට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) සමූපකාර සමිතියක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් කරනු ලැබූ විටක එම සමූපකාර සමිතියේ සෑම නිලධාරියෙක්ම එම වරදට වරදකරු විය යුතුය. තව ද එම වරද සිදුකිරීම වැලැක්වීම පිණිස අවශ්‍ය සියලුම කාර්යයන් තමා කල බවට හෝ එම වරද තමාගේ අනුදැනුමක් නොමැතිව සිදු කරන ලද බවට හෝ යම් නිලධාරියෙකු විසින් ඔප්පු කළහොත් මිස ඔහු වරදකරු බවට සලකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයේ පිහිටුවන ලෙස හෝ එබඳු ඕනෑම නියෝගයක් හෝ කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ විට එවැනි නියමයන්ට අනුව කටයුතු කිරීම පැහැර හැරීම හේතු කොට ගෙන යම් සමූපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විටක එවැනි සමූපකාර සමිතියක්-

(අ) 31(2) වැනි උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි දඬුවමකට අතිරේකව වරදකරනු ලැබීමෙන් පසු එය පැහැර හැරීම ඉදිරියටත් පවත්වා ගෙන යන එක් එක් දිනයක් පාසා එක් දිනය වෙනුවෙන් රු. 250 ක් බැගින් දඩ මුදලක් ගෙවීමට ද යටත් වන අතර,

(ආ) කොමිෂන් සභාවේ නියමයකට අනුකූලව එසේ සේවකයා නැවත සේවයෙහි පිහිට විය යුතු දින සිට අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වන දින දක්වා කාලය ඒ සේවකයාගේ සේවය අවසන් නොකොට දිගටම සේවයෙහි

රඳවා සිටියේ යැයි සලකා ඔහුට හිමිවිය යුතු වැටුප් හා වෙනත් දීමනා සියල්ල ගෙවීමට බැඳී සිටිය යුතුය.

(ඇ) යම් සේවකයෙකුට වැටුපක් හෝ අන්‍යාකාරයක දීමනාවක් හෝ වන්දියක් හෝ ගෙවන ලෙස කොමිෂන් සභාව නියම කරනු ලැබ ඇති විටක එම ගෙවීම පැහැර හරින ලද යම් සමිතියක් වරදකරු කරනු ලැබූ විට ඉහත (2) වැනි උප වගන්තිය යටතේ නියම කරනු ලැබූ දඬුවමකට අතිරේකව කොමිෂන් සභාව නියම කොට ඇති මුදල ද ගෙවීමට බැඳී සිටිය යුතුය.

(ඈ) මෙම උප වගනත්තියේ (ආ) හා (ඇ) වැනි ජේද යටතේ සමූපකාර සමිතිය ගෙවීමට යටත්වන මුදල ඒ සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් පනවනු ලබන දඩයක ස්වරූපයෙන් එම උසාවියේ ආඥාවක් අනුව අයකරනු ලැබිය හැකිය. ඒ අයකරන මුදල සේවකයාට ගෙවිය යුතුය.

5. මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යකදී කොමිෂන් සභාවේ තීරණයක නැතහොත් නියෝගයක නිවැරදි තාවය සලකා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳ තීරණය කිරීමට යම් මහෙස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නැතහොත් නියම නොකළ යුතුය.

කොමිෂන් සභාවට බලපෑම් කිරීම.

32. ස්වකීය රාජකාරි ඉටු කිරීමේදී හැර සෘජුව හෝ වක්‍රව හෝ අන් තැනැත්තෙකුගේ මාර්ගයෙන් හෝ කවර ආකාරයකින් හෝ කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි සාමාජිකයෙකුට යම් බලපෑමක් කරනු ලබන හෝ කිරීමට තැත්කරන හෝ සෑම තැනැත්තෙකුම වරදක් කරනු ලබන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රු. 5,000 නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට සිර දඬුවමක් යන දෙයාකාරයෙන් එක් ආකාරයක දඬුවමකට හෝ නැතහොත් එකී දඬුවම් දෙකටම යටත් කිරීමට හැකිය.

අනුමැතියක් රහිතව තොරතුරු හෙළිදරව් කිරීම කල නොහැකි බව.

33. කොමිෂන් සභාවේ සාමාජිකයෙකු එහි ලේකම් එහි කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන්කිසි තැනැත්තෙකු විසින් ස්වකීය නිල කාර්යයන් ඉටු කිරීමේ අවස්ථාවලදී හැර සිය රාජකාරි කටයුතුවලදී තමාට දැන ගන්නට ලැබෙන ලේඛනයක හෝ යම් සංදේශයක හෝ ඇතුලත් යම් තොරතුරක් අනාවරණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම නොකළ යුතුය.

කොමිෂන් සභාවේ සන්දේශනයක් වරප්‍රසාද වලින් යුක්ත බව.

34. කොමිෂන් සභාව හෝ එහි යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු සහ යම් සමිතියක් හෝ ඒ සමිතියේ කාරක සභාවේ සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හෝ සාමාජිකයෙකු අතර, කොමිෂන් සභාවේ නිල කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික සංදේශනයක අන්තර්ගත යම් කරුණක් යම් නීති කෘත්‍යයකදී හෙළිදරව් කිරීමට හෝ ඉදිරිපත් කිරීමට කොමිෂන් සභාවේ සභාපතිවරයා ලියවිල්ලකින් අනුමැතිය දී ඇතොත් විනා කිසිම තැනැත්තෙකුට අවසර නොතිබිය යුතුය.

සමූපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාල වීම

35. (1) කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත යම් සේවා නියුක්තියකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 3 (ආ) යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇතිනම් එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනය කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය යටතේ යම් සේවා නියුක්තියකු විසින් කොමිෂන් සභාවට යම් කරුණක් සම්බන්ධයෙන් යම් ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇතිනම් එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තිකයාට කාර්මික ආරවුල් පනත යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරියක් වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට බලයක් නොතිබිය යුතුය.

36. කොමිෂන් සභාවේ සභාපති හා සෑම සාමාජිකයෙකු ද කොමිෂන් සභාවේ සෑම නිලධාරියෙකු හා සේවකයෙකු ද දණ්ඩ නීති සංග්‍රහයේ පරමාර්ථය හා අර්ථය ඇතුලත රාජ්‍ය සේවකයෙකු වශයෙන් සැලකිය යුතුය. කොමිෂන් සභාවේ නිලධාරීන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව.

37. අල්ලස් පනතේ පරමාර්ථය හා අර්ථය ඇතුලත කොමිෂන් සභාව එම පනත යටතේ උපලේඛන ගත ආයතනයක් වශයෙන් සැලකිය යුතුය. අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

38. මෙම ප්‍රඥප්තිය බලාත්මක වීමත් සමඟ පහත සඳහන් ප්‍රඥප්ති ක්‍රියාත්මක වීම පරිච්ඡින්න විය යුතුය. ප්‍රඥප්තිය අවලංගු කිරීම.

(අ) ඌව පළාත් සභාවේ 1991 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය.

(ආ) ඌව පළාත් සභාවේ 1992 අංක 5 දරන සමුපකාර සමිති හා සමුපකාර සේවක කොමිෂන් සභා සංශෝධන ප්‍රඥප්තිය.

39. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. අනුකූලතාවක් ඇති වූවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

40. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි- අර්ථ නිරූපනය

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා ද,

"කොමසාරිස්" යන්නෙන් ඌව පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් ද,

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිතිවලට අදාල නීතිය යටතේ ලියාපදිංචි කරන ලද සමිතියක් ද,

"කාරක සභාව" යන්නෙන් ලියාපදිංචි කල සමුපකාර සමිතියක කටයුතු පිළිබඳ කළමණාකාරිත්වය භාරකරනු ලැබූ සමිතියේ පාලක මණ්ඩල අදහස් වන අතර, ලියාපදිංචිකළ සමිතියක අධ්‍යක්ෂක මණ්ඩලය හා කොමසාරිස්වරයා විසින් පත් කරන ලද තැනැත්තත් ද,

"නිලධාරියා" යන්නෙන් යම් සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් සඳහන් කෙරෙන සෑම අවස්ථාවකදී ම එම පදයෙන් සමූපකාර සමිතියක කාරක සභිකයන්, ලේකම් හා විධායක නිලධාරීන් ද,

"සේවකයා" යන්නෙන් සමුපකාර සමිතියක පත්වීමක් ලැබ වැටුප් හෝ දීමනාවක් පාරිශ්‍රමිකයක් ලබන හා නිශ්චිත කාර්ය භාරයක් පවරන ලද සේවකයෙකු ද අදහස් කරනු ලැබේ.

## උපලේඛන - අංක 01

ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජිකයෙකු විසින්, ඌව පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 10(1) වැනි වගන්තිය ප්‍රකාර දිවුරුම් දීම/ප්‍රතිඥා දීම.

ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සමාජික වශයෙන් පත් කරනු ලැබ සිටින.................................................. ......................................................................................................................................... වන මම, මා වෙත පැවරී ඇති ඌව පාළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික ධූරයට අයත් කාර්යයන් භයින් හෝ පක්ෂපාතීත්වයෙන් ද, දයාවෙන්ද හෝ ද්වේශයෙන්ද තොරව සම්පූර්ණයෙන් යුක්ති ගරුකව හා සාධාරණව ඉටු කරන බවටත්, මගේ නිල කාර්යයන් ඉටු කිරීමේ දී ඉහත ධූරයට අයත් කාර්යයන් සම්බන්ධයෙන් වූ කවර කරුණක් පිළිබඳව හෝ ඍජුව නැතහොත් වක්‍රාකාරයකින් හෝ කුමන පුද්ගලයෙකුට වුව ද හෙළි දරව් නොකරන බවටත් අවංකව ද ගාම්භිරතා පූර්වකව ද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි/ප්‍රතිඥා දෙමි.

..................................................................

අත්සන.

20........... ක් වූ...................... මස................. වැනි දින දී මා ඉදිරිපිට දී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

..................................................................

පළාත්බද මහාධිකරණ විනිශ්චයකාර

**උපලේඛන - අංක 02**

ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු විසින්, ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 10(2) වගන්තිය ප්‍රකාර කරනු ලබන දිවුරුම/ප්‍රතිඥාව,

ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු වශයෙන් එකී ධුරයේ කාර්යයන් කිරීමට නියම කරනු ලැබ සිටින .................................................................................................................................................................. වන මම ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරී තනතුරට අයත් කාර්යයන් ඉටු කිරීමේ හැර අන් කවර විටකදී වුවත් එකී තනතුරේ කටයුතු කිරීමේ දී මට දැන ගැනීමට ලැබෙන්නාවූ ලේඛනයක, සංදේශයක හෝ තොරතුරක අන්තර්ගත කරුණු සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් හෝ සෘජුව නැතහොත් වක්‍රාකාරයකින් හෝ කුමන පුද්ගලයෙකුට වුවත්, අනාවරණය නොකරන බවට අවංකව ද, ගාම්භීරතා පූර්වකව ද ප්‍රකාශ කොට දිවුරුම් දෙමි/ප්‍රතිඥාදෙමි.

...................................................................
අත්සන.

20........... ක් වූ...................... මස................. වැනි දින දී මා ඉදිරිපිටදී දිවුරුම් දෙන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

...................................................................
(සභාපති)
ඌව පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාව

02-49/1

---

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 05 දරන ඌව පළාතේ, ගෙවල් කුලී ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව 2010 දෙසැම්බර් 24 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන.,
පළාත් සභා ලේකම්
ඌව පළාත් සභාව.

2011 ජනවාරි මස 05 වැනි දින,
බදුල්ල රජවීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

***ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 05 දරන ඌව පළාතේ ගෙවල් කුලී ප්‍රඥප්තිය***

ඌව පළාතේ ජීවත් වන කුලී නිවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා ද, පදිංචිය සඳහා ඔවුන්ට අවශ්‍ය වන්නා වූ පහසුකම් සැලසීම හා ඔවුන්ගේ සුභ සිද්ධිය සලසා දීම සඳහා ද, එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන්නා වූ නිතීමය ප්‍රතිපාදන සැලසීම සහ නීත්‍යානුකූල බලය සහිත ආයතන හා සංවිධාන සංස්ථාපනය කර පවත්වාගෙන යාම සඳහා ද එයට ආනුෂාංගික වූ කරුණු ඉටුකරලීම පිණිස විධිවිධාන සැලැස්වීම සඳහා ද පනවනු ලබන ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත හා එයට පසුව කරන ලද සංශෝධන පනත් වලටද අනුකූල වන්නේය.

## ඌව පළාතේ පළාත් සභාව

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයෙන් පළාත් සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.**

*ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය*

1. මෙම ප්‍රඥප්තිය 2010 අංක 5 දරන ඌව පළාත් ගෙවල් කුලී ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට හෝ නියම කරන පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වන්නේය.

*පනත් අදාල කර ගැනීම*

2. මෙහි මින් මතු "අදාල පනත්" යනුවෙන් සඳහන් කරනු ලබන 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත හා ඊට අදාල සංශෝධන පනත්වල සඳහන් කාර්ය හා කර්තව්‍ය ඌව පළාත තුළ ඉටු කිරීම පිණිසත්, එහි සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම පිණිසත් මෙහි මතු සඳහන් පරිදි වගකීම් පවරා දීම නීත්‍යානුකූල වන්නේ ය.

*ඌව පළාත*

3. මෙහි මින් මතු "පළාත" යනුවෙන් හඳුන්වනු ලබන බදුල්ල හා මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක දෙකෙන් ආවරණය වන ප්‍රදේශය "ඌව පළාත" ලෙස හඳුන්වනු ලැබේ.

*පළාත් සභාව*

4. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 වැනි සංශෝධනය ප්‍රකාරව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනත අනුව ඌව පළාත සඳහා පිහිටුවා ගන්නා ලද තත්කාලයෙහි ක්‍රියාත්මක වන්නා වූ ව්‍යවස්ථාපිත දේශපාලන අධිකාරිය ඌව පළාතේ පළාත් සභාව ලෙස හඳුන්වනු ලබන අතර, අදාල පනත් වල පාර්ලිමේන්තුව යනුවෙන් සඳහන් කර එයට, පවරා ඇති සියළු වගකීම් එම පනත් මෙම පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී පළාත් සභව විසින් ඉටු කරනු ලැබිය යුතුය.

   (2) අදාල පනත්වල නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ලෙස සඳහන් කර එය වෙත පවරා ඇති සියළු වගකීම් එම පනත් මෙම පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී ඌව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විසින් ඉටුකරනු ලැබිය යුතුය.

*පළාත් අමාත්‍යවරයා*

5. (1) ඌව පළාතේ පළාත් සභාවේ නිවාස විෂය භාර අමාත්‍යවරයා මෙහි පළාත් අමාත්‍යවරයා ලෙස හඳුන්වනු ලබන අතර, අදාල පනත් වල "අමාත්‍යවරයා" ලෙස සඳහන් කර ඔහු වෙත පවරා ඇති සියළු කාර්ය හා කර්තව්‍ය පළාත තුළ ඉටු කිරීම ද, බලතල ක්‍රියාත්මක කිරීම ද පළාත් අමාත්‍යවරයා විසින් සිදු කිරීම නීත්‍යනුකූල වන්නේ ය.

   (2) අදාල පනත්වල අමාත්‍යවරයා විසින් සාදනු ලැබ තත්කාලයෙහි බලපවත්නා නියෝග පළාත් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග ලෙස සැළකිය යුතු අතර, අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත් යටතේ අමත්‍යවරයා විසින් පනවා ඇති නියෝග අනුව ක්‍රියා කිරීම නිත්‍යානුකූල විය යුතුය. එසේම තත්කාලයෙහි බල පවත්නා

*පළාත් නිවාස දෙපාර්තමේන්තුව පිහිටුවීම*

6. අදාල පනත් වල සඳහන් කාර්ය හා කර්තව්‍යය ඌව පළාත තුළ ඉටු කිරීම සඳහා පළාත් නිවාස දෙපාර්තමේන්තුවක් සංස්ථාපනය කළ යුතුය. එම දෙපාර්තමේන්තුව ඌව පළාත් නිවාස විෂය භාර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන වෙනම ඒකකයක් හෝ අංශයක් ලෙස පැවතිය යුතුය.

7. අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එකී පනත්වල "ජාතික නිවාස දෙපාර්තමේන්තුව" ලෙස සඳහන් කර එය වෙත පවරා ඇති සියලු කාර්යය හා කර්තව්‍ය 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් පමණට, පළාත තුළ ඉටු කිරීම ද, වගකීම් දැරීම ද ඉහත 6 වැනි ඡේදයේ සඳහන් පළාත් නිවාස දෙපාර්තමේන්තුව විසින් සිදුකිරීම නිත්‍යානුකූල වන්නේ ය.

*පළාත් නිවාස කොමසාරිස්*

8. (1) ඉහත 6 වැනි ඡේදයේ සඳහන් පළාත් නිවාස දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් නිවාස කොමසාරිස්වරයෙකු ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු අතර, ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විය යුතුය.

   (2) අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල "ජාතික නිවාස කොමසාරිස්වරයා" හෝ "කොමසාරිස්වරයා" ලෙස සඳහන් කර ඔහු වෙත පවරා ඇති සියලු කාර්යය හා කර්තව්‍ය 13වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ සඳහන් පමණට ඌව පළාත තුළ ඉටු කිරීම ද එකි පනත්වලින් ඔහු වෙත පවරා ඇති බලතල ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීම ද පළාත් නිවාස කොමසාරිස්වරයා විසින් සිදුකල යුතු අතර, එසේ සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

*පළාත් නිවාස ගිණුම*

9. අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල "ජාතික නිවාස අරමුදල" හෝ "අලුත් වැඩියා අරමුදල" ලෙස සඳහන් කර එම අරමුදල වෙත පවරා ඇති සියලු කාර්යයන් පළාත තුළ ඉටු කිරීම සඳහා "පළාත් නිවාස ගිණුම" ලෙස හඳුන්වනු ලබන අරමුදලක් ඇති කළ යුතු අතර, අදාල පනත්වල ජාතික නිවාස අරමුදල මගින් ඉටු කරනු ලබන සියලු කාර්යයන් ඌව පළාත තුළ ඌව පළාත් නිවාස ගිණුම මගින් ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේය.

*ප්‍රාදේශීය සභාව ඇතුලත් කිරීම*

10. (1) අදාල පනත්වල "ප්‍රාදේශීය බල මණ්ඩල" යනුවෙන් හඳුන්වා ඇති සියලු තැන්හි දී තත්කාලයේ ක්‍රියාත්මක ප්‍රාදේශීය සභාවන් ද ඇතුලත් විය යුතු අතර, එම පනත් වල සුළු නගර සභා හා ගම් සභා ලෙස සඳහන් කර ඇති සියලුතැන් වලට "ප්‍රාදේශීය සභා" ආදේශ කරමින් අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීම නීතිය්‍යානුකූල වන්නේ ය.

    (2) අදාල පනත් ඌව පළාත තුළ ක්‍රියාත්මක කිරීමේ දී එම පනත්වල සුළු නගර සභා හා ගම් සභා ලෙස සඳහන් කරමින් එම ආයතන වෙත පවරා ඇති සියලු බලතල, කාර්යය හා කර්තව්‍ය ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම හා එම වගකීම් දැරීම නීත්‍යානුකූල වන්නේ ය.

*අනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව*

11. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

02 - 49/2

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 06 දරන ඌව පළාතේ, නිවාස සංවර්ධන ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව 2010 දෙසැම්බර් 24 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන

පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 ජනවාරි මස 05 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

### ඌව පළාතේ පළාත් සභාව

***ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 06 දරන ඌව පළාත් නිවාස සංවර්ධන ප්‍රඥප්තිය***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන සංශෝධනයේ ප්‍රකාරව පළාත් සභාවලට බලතල පැවරීමේ විධිවිධානවලට අනුකූලව ඌව පළාත තුළ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ඔවුන්ට ද්‍රව්‍ය අධාර, ණය හෝ මූල්‍ය ආධාර ලබා දීම, ඉඩම් හෝ ඉදිකරන ලද නිවාස ලබා දීම ද ඇතුලුව නිවාස පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය කිරීම, ප්‍රගති පාලනය කිරීමද එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම හා ඒ සඳහා වෙන් කර ඇති මුදල් කළමනාකරණය කිරීම ද, නිවාස සංවර්ධන අරමුණ ඇතිව ජනතා සහභාගිත්වය ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රජා සංවිධාන ස්ථාපනය කිරීම සහ එම සංවිධානවලට බලතල පැවරීම සඳහා ද, නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිස පනවනු ලබන ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තිය 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතට අනනුකූලවේ.

පූර්විකාව — ඌව පළාත් වාසී සියලුදෙනා හට පදිංචියට සුදුසු නිවසක් සපයා දීම හෝ ලබා ගැනීමට හෝ ඉදිකර ගැනීමට අවශ්‍ය ආධාර ලබා දීම තුලින් ඔවුන්ගේ නිවාස අවශ්‍යතාවය සුපරාලීම ඌව පළාතේ පළාත් සභාවේ ප්‍රතිපත්තිය වන හෙයින්;

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ:-**

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය — 1. මෙම ප්‍රඥප්තිය 2010 අංක 6 දරන ඌව පළාත් නිවාස සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මෙහි මින් මතු "ආණ්ඩුකාරවරයා" ලෙස හඳුන්වනු ලබන ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දිනක සිට හෝ ආණ්ඩුකාරවරයා විසින් නියම කරන දිනක සිට ක්‍රියාත්මක වේ.

### *I* වන කොටස

සාමාන්‍ය

අරමුණ — 2. ඌව පළාත තුළ වාසය කරන ජනතාවට පදිංචිය සඳහා සුදුසු නිවාස ලබා ගැනීමට හෝ ඉදිකරගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම මෙම ප්‍රඥප්තියේ අරමුණ විය යුතුය.

නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුව — 3. ඉහත 2 වගන්තියේ සඳහන් අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා සහ මෙම ප්‍රඥප්තියේ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීම පිණිස ඌව පළාත සඳහා නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවක් (මෙහි මින් මතු "දෙපාර්තමේන්තුව" ලෙස හඳුන්වනු ලබන) පැවතිය යුතු අතර එය වෙනම දෙපාර්තමේන්තුවක් හෝ ඒකකයක් ලෙස සංවිධානය කළ යුත්තේ ය.

පළාත් නිවාස කොමසාරිස් — 4. ඉහත 3 වගන්තියේ සඳහන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස පළාත් නිවාස කොමසාරිස්වරයකු (මෙහි මින් මතු "කොමසාරිස්" වශයෙන් හඳුන්වනු ලබන) ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු විය යුතුය.

5. පළාත් නිවාස කොමසාරිස්වරයාට සහයවනු පිණිස සහකාර කොමසාරිස්වරුන් හෝ සෙසු නිලධාරීන් පත්කළ හැකිය. සෙසු නිලධාරීන් පත් කිරීම

6. පළාත් නිවාස කොමසාරිස්වරයා ඌව පළාත් නිවාස විෂය භාර අමාත්‍යාංශයේ (මෙහි මින් මතු "අමාත්‍යවරයා" ලෙස හඳුන්වනු ලබන) අමාත්‍යවරයාගේ සාමාන්‍ය හා විශේෂ විධිවිධානයන්ට හා ඌව පළාත් නිවාස විෂය භාර අමාත්‍යංශයේ ලේකම්වරයාගේ (මෙහි මින් මතු "ලේකම්" වරයා ලෙස හඳුන්වනු ලබන) විධානයන්ට හා අධීක්ෂණයට යටත්ව ක්‍රියා කළ යුතුය.

## *II වන කොටස*

### *බලතල හා කාර්යයන්*

7. අමාත්‍යවරයා හා ලේකම්වරයාගේ විධානයන්ට යටත්ව පහත සඳහන් කාර්යන් හා කර්තව්‍යයන් ඉටු කිරීම නිවාස කොමසාරිස්වරයාගේ වගකීම වන්නේ ය. නිවාස කොමසාරිස්වරයාගේ කාර්ය හා කර්තව්‍යයන්

(1) අඩු ආදායම් ලාභීන් සඳහා සහ මහජන ආධාර ලබන්නන් සඳහා නිවාස ආධාර ලෙස ද්‍රව්‍ය හෝ මුදල් ලබාදීමේ ව්‍යාපෘති සංවිධානය කිරීම.

(2) අඩු ආදායම් ලාභීන් වෙත නිවාස සංවර්ධනය සඳහා ණය මුදල් ලබාදීම.

(3) ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති සංවිධානය කිරීම.

(4) නිවාස සංවර්ධනය උදෙසා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

(5) නිවාස සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් යටිතල පහසුකම් සැලසීම.

(6) මහජන අයිතියට පවරා ඇති නිවාස ව්‍යාපෘතිවලට තව දුරටත් අවශ්‍ය වන පහසුකම් සැලසීම.

(7) නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම, එම ඉඩම් සංවර්ධනය කිරීම, එම ඉඩම්වල නිවාස ඉදිකිරීම.

(8) නිවාස ලාභීන් හෝ ඉඩම් ලාභීන් හඳුනා ගැනීම, තෝරා ගැනීම ඔවුන් සඳහා නිවාස හෝ ඉඩම් පවරා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(9) නිවාස ඉදිකර ගැනීම සඳහා සුදුසු ඉඩම් නොමැති අය හට යෝග්‍ය ඉඩම් ලබාදීම.

(10) ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් ලබාදීම සඳහා සුදුසු ක්‍රමවේදයන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සකස් කිරීම.

(11) ණය මුදල් හෝ දේපල වටිනාකම් ආපසු අයකර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සකස් කිරීම.

(12) නිවාස සංවර්ධන අරමුණු වෙනුවෙන් විවිධ ප්‍රභවයන්ගෙන් ලැබෙන මුදල් අමාත්‍යවරයාගේ හා ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව සුදුසු ව්‍යාපෘති සඳහා යෙදවීම.

(13) නිවාස සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පරිපාලනය, කලමනාකරණය, අධීක්ෂණය හා පසු විපරම් කිරීම.

(14) නිවාස සංවර්ධ කාර්යයන් උදෙසා ප්‍රජා සංවිධාන ස්ථාපනය කිරීම සඳහා සුදුසු කටයුතු කිරීම හා එවැනි සංවිධාන ලියාපදිංචි කිරීම.

(15) නිවාස සංවර්ධන කාර්යයන් හා සම්බන්ධව වෙනත් ආයතන හා සංවිධාන සමඟ නිවාස සංවර්ධන අරමුණු සහිත කාර්යයන් සඳහා ලේකම්වරයා වෙනුවෙන් ලිඛිත ගිවිසුම් ඇති කර ගැනීම සඳහා නිල ලියකියවිලි වලට අත්සන් තැබීම සහ එවැනි ආයතන හා සංවිධාන සමඟ එක්ව කටයුතු කිරීම.

(16) මෙම ප්‍රඥප්තියේ කටයුතු සඳහා දේශීය වශයෙන් අරමුදල් සැපයෙන මාර්ගවලින් මුදල් ණයට ගැනීම සඳහා නිවාස ලාභීන්ට පහසුකම් සැලසීම.

(17) මෙම ප්‍රඥප්තියේ ප්‍රකාර ලබාදෙන ගොඩනැගිලි සඳහා කුලිය, බදු කුලිය හෝ ගාස්තු අය කිරීම හා භාර ගැනීම.

අමාත්‍යවරයා සතු බලතල

8. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා අමාත්‍යවරයාට පහත සඳහන් බලතල තිබිය යුතු ය.

(1) නිවාස සංවර්ධන අරමුණු සහිත වූ චංචල හෝ නිශ්චල දේපළ තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකට භාර ගැනීම, සුරක්ෂිත කිරීම, පාලනය කිරීම, විකිණීම, බදු දීම, උකස් කිරීම, හුවමාරු කිරීම හෝ නිවාස සංවර්ධන අරමුණු උදෙසා වෙනත් ආකාරයකට බැහැර කිරීම සඳහා අනුමැතිය ලබා දීම.

(2) නිවාස ද්‍රව්‍ය ආධාර, මූල්‍ය ආධාර, ණය ආධාර, ඉඩම් හෝ නිවාස ලබාදීමේ දී අඩු ආදායම් ලාභීන්ගේ හෝ ප්‍රතිලාභීන්ගේ ආදායම් සීමාව ඇතුළු අනෙකුත් සුදුසුකම් තීරණය කිරීම සහ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ කාර්යය හෝ නිවාස සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කමිටු පත්කිරීම.

(3) නිවාස සංවර්ධන අරමුණක් සඳහා වෙන් කරන ලද ඉඩමක් එකී කාරණය සඳහා යොදවා ගැනීම අනුමත කිරීම.

(4) ණය මුදල්, ආධාර මුදල්, ඉඩම්, නිවාස හෝ ද්‍රව්‍ය ආධාර ලබා දීමේ දී මුදල, පොළිය, වාරිකය, ප්‍රමාණය, කාලය ආදී අදාළ සීමාවන් තීරණය කිරීම.

(5) ආපසු අයකර ගන්නා ණය මුදල් මගින් නැවත ණය ලබාදීම සඳහා අවශ්‍ය තීරණ ගැනීම.

(6) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් උදෙසා සුදුසු නියෝග පැනවීම.

ප්‍රතිපාදන සැලැස්වීම

9. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත් සභා වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන සැලසිය යුතු වන්නේය.

(2) නිවාස සංවර්ධන කාර්යයන් උදෙසා නිවාස සංවර්ධන විෂයභාර අමාත්‍යාංශය විසින් හෝ දෙපාර්තමේන්තුව විසින් හෝ සංවිධානය කරන කටයුතුවලින් උපයන ආදායම් පළාත් සභා ගිණුම් හරහා පළාත් අමාත්‍යාංශය වෙත ලබා දිය යුතු ය.

(3) නිවාස සංවර්ධනය උදෙසා සංවිධානය කරන ලොතරැයි ආදායම් අමාත්‍යාංශය වෙත භාරගත හැකිය.

(4) නිවාස සංවර්ධනය සඳහා විවිධ මූලාශ්‍රවලින් ලැබෙන පරිත්‍යාග අමාත්‍යාංශය වෙත භාරගත හැකිය.

(5) රාජ්‍ය නොවන සංවිධානවලින් කරනු ලබන ප්‍රදානයන් අමාත්‍යාංශය වෙත ලබාගත හැකිය.

(6) මෙම ප්‍රඥප්තිය ප්‍රකාරව අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරන දේපළ වලින් කුලී ගාස්තු හෝ බදු මුදල් හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන විවිධ ආදායම් අමාත්‍යාංශය වෙත බාරගත හැකිය.

(7) ණය වාරික අයකිරීමෙන් හෝ දේපළ බැහැර කිරීමෙන්, වාරික වශයෙන් හෝ එකවර ලැබෙන ආදායම් අමාත්‍යාංශය වෙත භාර ගත හැකිය.

නිවාස සංවර්ධන ගිණුම

10. (1) ඉහත 9 වගන්තිය ප්‍රකාර ලැබෙන විවිධ ආදායම් පළාත් නිවාස සංවර්ධන ගිණුමක (මෙහි මින් මතු "ගිණුම" ලෙස හඳුන්වනු ලබන) එක් රැස් කිරීමට හැකි විය යුතු යි.

(2) ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වේ.

(3) මෙම ගිණුම 1987 පළාත් සභා පනතේ 42 පරිච්ඡේදය පරිදි විගණනයට යටත් වේ. ඌව පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂවරයාගේ විගණනයට ද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට යටත්විය යුතු ය.

(4) මෙම ගිණුම ලේකම්වරයාගේ ඍජු අධීක්ෂණයට යටත්විය යුතු ය.

නිවාස සංවර්ධන සමිතිය

11. (1) නිවාස සංවර්ධනය අරමුණු කරගත් වැඩ සටහන්වලට සහය ලබා ගැනීම පිණිස ප්‍රජාවගෙන් සමන්විත වූ නිවාස සංවර්ධන සමිති පිහිටුවීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) ඉහත (1) උප වගන්තියෙහි සඳහන් සමිති පිහිටුවීම සහ පරිපාලනය කිරීම සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස්කර නියෝගයක් ලෙස අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් බලාත්මක කළ හැකිය.

(3) ඉහත (2) උප වගන්තිය පරිදි ව්‍යවස්ථානුකූලව පිහිට වූ සමිති කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කර ඒ බව සනාථ කරනු වස් සහතිකයක් නිකුත් කළ හැකිය.

(4) ලියාපදිංචි කරන ලද නිවාස සංවර්ධන සමිතියක් සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව නිවාස සංවර්ධනය අරමුණු කරගත් සංවර්ධන ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට හැකිවිය යුතු අතර පිරිනැමිය හැකි කොන්ත්‍රාත්තුවේ උපරිම වටිනාකම කලින් කල මහා භාණ්ඩාගාරයේ හෝ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් එවැනි සමිති සඳහා නියම කරනු ලබන සීමාවන්ට යටත් විය යුතු ය.

(5) නිවාස සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා කොමසාරිස්වරයාට හෝ ලේකම්වරයාට නිවාස සංවර්ධන සමිතිවල සහාය ලබා ගත හැකිය.

12\. (1) මෙම ප්‍රඥප්තිය යටතේ ඉඩමක්, නිවසක්, ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් හෝ වෙනත් ආධාරයක් ලබා ගන්නා ලද ප්‍රතිලාභින් කොමසාරිස්වරයා සමඟ තම නිවාස සංවර්ධන අරමුණ සම්පූර්ණ කිරීම සඳහා සුදුසු කොන්දේසි ඇතුළත් ගිවිසුමකට (මෙහි මින්මතු "ගිවිසුම" යනුවෙන් හඳුන්වනු ලබන) ඇතුළත් විය යුතු වන්නේය. ප්‍රතිලාභීන්ගේ වගකීම්

(2) ඉහත (1) උපවගන්තියෙහි සඳහන් ගිවිසුම ප්‍රකාර ක්‍රියා නොකරන ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇති ඉඩම, නිවස, ද්‍රව්‍ය ආධාර, මුදල් ආධාර, ණය මුදල් හෝ වෙනත් ආධාර ආපසු අයකර ගැනීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට කොමසාරිස්වරයාට හැකි විය යුතු ය.

(3) ඉහත (2) උප වගන්තිය ප්‍රකාර මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට පෙර ගිවිසුමේ කොන්දේසි කඩකර ඇති බව ප්‍රතිලාභියා වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවීමටත් කොන්දේසි යථාවත් කිරීමට දින 21 කට නොඅඩු ප්‍රමාණවත් කාලයක් ලබා දීමටත් කොමසාරිස්වරයා කටයුතු කළ යුතු ය.

(4) ඉහත (2) උප වගන්තිය ප්‍රකාර ඉල්ලීමක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමේ දී ගිවිසුමේ සඳහන් දේපළෙහි හෝ ද්‍රව්‍යයෙහි හෝ මුදලෙහි හෝ වටිනාකමට අමතරව එම වටිනාකමින් 25% ගාස්තුවක් ද, පරිපාලන වියදමක් ලෙස අයකර ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(5) ඉහත (2) උප වගන්තිය ප්‍රකාර අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ආපසු ලබා ගත් හෝ අයකර ගත් ඉඩම, නිවස, ද්‍රව්‍ය හෝ මුදල සුදුසුකම් ඇති වෙනත් ප්‍රතිලාභියෙකු වෙත කොමසාරිස්වරයා විසින් ලබාදීම නීත්‍යානුකූල වන්නේය.

(6) ඉහත (2) උප වගන්තිය ප්‍රකාර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් අයකර දෙනු ලබන සියලු මුදල් නිවාස සංවර්ධන ගිණුමට බැර කළ යුතු ය.

## *III වැනි කොටස*

### පොදු විධිවිධාන

13\. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කිසියම් ඉඩමක් හෝ ඒ ඉඩමේ යම් සම්බන්ධතාවයක් හෝ අවශ්‍ය වන්නේ නම් එකී ඉඩම හෝ සම්බන්ධතාවය (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ ඌව පළාත් සභාව වෙනුවෙන් රජය විසින් අත්කර ගනු ලැබිය හැකිය. දේපළ අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම

(2) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පළාත ඇතුළත වූ යම් රජයේ ඉඩමක් අවශ්‍ය වන අවස්ථාවක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ II වැනි පරිශිෂ්ඨයේ 1.1:2 වගන්තිය ප්‍රකාරව පියවර ගනු ලැබිය යුතු ය.

(3) ඉඩම් අත්කර ගැනීම හෝ වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදලේ ප්‍රමාණය ගණනය කිරීමේ දී (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව වන්දි ගෙවනු ලැබිය යුතු අතර ඒ සඳහා යන වියදම පළාත් සභා අරමුදලෙන් දැරිය යුතු ය.

(4) මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා සුදුසු ඉඩමක් අත්පත් කර ගැනීම සඳහා හඳුනාගත්විට අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේද, පළාත් සභාවේද, ආණ්ඩුකාරවරයාගේද අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එකී ඉඩම අත්පත් කර ගැනීමේ කාර්යය ආරම්භ කළ යුතු වන්නේය.

(5) ඉහත (1) හෝ (2) උප වගන්තිය යටතේ අත්පත් කර ගන්නා ලද ඉඩමක් නිවාස සංවර්ධන කාර්යයකින් බැහැර වූ වෙනත් කිසියම් කාර්යයක් සඳහා යොදා නොගත යුතු ය.

14\. (1) ඉඩමක් හෝ නිවසක් මෙම ප්‍රඥප්තියේ ප්‍රකාරව කිසියම් ප්‍රතිලාභියෙක් වෙත බැහැර කිරීමේ දී, එම දේපළෙහි වටිනාකම ප්‍රතිලාභියා විසින් පළාත් සභාව වෙත, කොමසාරිස්වරයා විසින් දැනුම් දෙන ආකාරයකට වාරික වශයෙන් හෝ එකවර හෝ ගෙවිය යුතු යි. දේපළ බැහැර කිරීම

(2) ඉහත (1) උප වගන්තිය යටතේ බැහැර කරන ලද දේපළෙහි සම්පූර්ණ වටිනාකම ආපසු අයකර ගැනීමෙන් අනතුරුව එම දේපළ වෙනුවෙන් නොතාරිස් ඔප්පුවක් ලියා අත්සන් කර දීමෙන් එහි අයිතිය පවරා දීමට කොමසාරිස් වරයාට හැකිවිය යුතු ය.

(3) ඉහත (2) උප වගන්තිය යටතේ ඉඩමක් බැහැර කිරීම සිදුකල යුත්තේ එහි නිවාසයක් ඉදිකර අවසන් වීමෙන් අනතුරුව පමණි.

නියෝග

15. (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය හා කර්තව්‍ය ඉටු කර ගැනීම පිණිසත් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහාත්, එහි කටයුතු විධිමත්ව පරිපාලනය කිරීම සඳහාත් අවශ්‍ය වන්නා වූ සුදුසු හා යෝග්‍ය නියෝග පැනවීම අමාත්‍යවරයා විසින් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

(3) *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන නියෝග එසේ පළකළ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් පසු දිනෙක සිට බලාත්මක වන්නේය.

(4) *ගැසට් පත්‍රයේ* පළකිරීමෙන් පසු එම නියෝග පළාත් සභාවේ සම්මතකර ගැනීම සඳහා අමාත්‍යවරයා විසින් පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) ඉහත (4) වැනි උපවගන්තිය යටතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කරන ලද නියෝග පළාත් සභාව විසින් සම්මත කරනු නොලැබුව හොත් ඒ බව ද *ගැසට්* නිවේදනයක් මගින් මහජනතාව වෙත දැනගැනීමට සැලැස්වීම අමාත්‍යවරයාගේ වගකීමකි.

(6) ඉහත (3) වැනි උපවගන්තියේ සඳහන් *ගැසට්* නිවේදනය පළකිරීමෙන් පසුව සහ (5) වැනි උපවගන්තියේ සඳහන් දැන්වීම පළකිරීම අතර කාලය තුළ එම නියෝගය යටතේ කරන ලද කිසියම් කාර්යයක් නීත්‍යානුකූල නොවන කාර්යයක් ලෙස නොසැලකිය යුතු ය.

අර්ථ නිරූපනය

16. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස;

"පළාත" යන්නෙන් බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්ක දෙකෙන් සැදුම්ලත් ඌව පළාත ද, "පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යාංශය" යන්නෙන් ඌව පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂය පිළිබඳ කටයුතු කරන අමාත්‍යාංශයද,

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාද,

"ලේකම්" යන්නෙන් ඌව පළාත් සභාවේ නිවාස සංවර්ධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාද,

"කොමසාරිස්" යන්නෙන් ඌව පළාත් සභාවේ නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාද,

"දෙපාර්තමේන්තුව" යන්නෙන් ඌව පළාත් සභාවේ නිවාස සංවර්ධන දෙපාර්තමේන්තුව හෝ නිවාස සංවර්ධන කාර්යය ඉටු කිරීමේ අරමුණින් ස්ථාපිතකර ඇති අංශයක් හෝ ඒකකයක්ද,

"ගිණුම" යන්නෙන් ඌව පළාත් නිවාස සංවර්ධන අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන නිවාස සංවර්ධන අරමුණ ඇතිව ස්ථාපිත කරනු ලැබ ඇති නිවාස සංවර්ධන ගිණුමද,

"සමිතිය" යන්නෙන් මෙම ප්‍රඥප්තිය යටතේ නිවාස සංවර්ධන කාර්යයන් සඳහා මහජනතාවගේ සහභාගීත්වය ඇතිව පිහිටුවා ඇති නිවාස සංවර්ධන සමිති ද, අදහස් කෙරේ.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

17. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වචනාර්ථ හෝ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුව හොත්, එවිට සිංහල වචනාර්ථය හා භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

02-49/3

## ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 08 දරන ඌව පළාතේ, සමාජ සේවා ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 දෙසැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව 2010 දෙසැම්බර් 30 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 ජනවාරි මස 05 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

### ඌව පළාතේ පළාත් සභාව

### ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක 08 දරන ඌව පළාතේ සමාජ සේවා ප්‍රඥප්තිය

ඌව පළාත තුළ පදිංචි අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය කිරීම, දිළිඳු සහ අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, ජීවිකා වෘත්තියක යෙදිය නොහැකි ක්ෂය රෝග, පිළිකා, ලාදුරු, තැලසීමියා වකුගඩු රෝගාබාධ සහිත තැනැත්තන් සඳහා ආධාර සැපයීම, කායික මානසික සහ සාමාජික වශයෙන් ආබාධිත සහිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ සුභසාධනය, අබල සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම, ත්‍රස්තවාදී ක්‍රියාවන් සහ වාර්ගික ක්‍රියාවන් හේතුවෙන් මරණයට පත්වීම හෝ සිවිල් යුද්ධයකදී හෝ ස්වාභාවිකව සිදු වන විශාල ආපදාවන් හේතුවෙන් ආබාධිත තත්ත්වයට පත්වන තැනැත්තන්ට සහන සැලසීම ඇතුළු සුභසාධන සේවාවන් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට සහ ඌව පළාත තුළ නව සමාජ සංවර්ධන ප්‍රවේශයක් ඇති කරලීමට විධිවිධාන සැලැස්වීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය 2010 අංක 08 දරණ ඌව පළාත් සභාවේ සමාජ සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දිනයේ සිට ක්‍රියාත්මක විය යුතුය. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)*

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත පඳහන් පරිදි වේ. *(ප්‍රඥප්තියේ අරමුණු)*

   1. ඌව පළාත තුළ පදිංචි, සුභසාධන සේවා සැලසිය යුතු දිළිඳු හා අසරණ පුද්ගලයින්ට ආධාර හා සහන සේවාසැපයීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

   2. අඩු ආදායම්ලාභී පවුල් වල කායික, මානසික සහ සමාජයීය වශයෙන් අබාධ සහිත තැනැත්තන් සහ අසරණවූ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආරක්ෂණය ලබා දීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

   3. කායික, මානසික සහ සමාජයීය වශයෙන් ආබාධ සහිත තැනැත්තන් හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පවත්වාගෙන යනු බලන ස්වේච්ඡා නිවාස/ආයතන සඳහා ආධාර ලබා දීම හා ඒවා අධීක්ෂණය කිරීම.

   4. ත්‍රස්තවාදී ක්‍රියාවන් හා වාර්ගික ක්‍රියාවන් හේතුවෙන් මරණයට පත්වීම හෝ සිවල් යුද්ධයකදී හෝ ස්වාභාවික ආපදාවකදී ආබාධිත තත්ත්වයට පත්වූ පුද්ගලයින්ට ආදායම් සීමාව නොසලකා ආධාරක උපකරණ සැපයීම හා මූල්‍යමය ආධාර කිරීම.

   5. පාසල් ළමුන් දහම් පාසල් ළමුන්, වැන්දඹු හා අවිවාහක කාන්තාවන්, සිරගත වූ අයගේ පවුල්වල සාමාජිකයන්, ආබාධ සහිත තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයින් හා සමාජයේ ආරක්ෂණය අහිමිව අසරණව සිටින අයගේ පවුල් වල සාමාජිකයින් අරමුණු කරගෙන විවිධ වූ සමාජ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම තුළින් ඔවුන් සමාජ ගත කිරීම සහ සංස්කෘතික සාරධර්ම සුරක්ෂිතව පවත්වාගෙන යාමට විවිධ වූ වැඩසටහන් සම්පාදනය කර, ක්‍රියාත්මක කිරීම.

6. අනාථ, අසරණ හා අත්හළ දරුවන්, වීදි දරුවන් සහ සමාජයේ රැකවරණය අහිමි දරුවන් සම්බන්ධව සමාජ සංවර්ධන වැඩසටහන් සම්පාදනය කර, ක්‍රියාත්මක කිරීම.

පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

3. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටු කිරීම සඳහා දැනට පිහිටුවා ඇති ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් පසු "දෙපාර්තමේන්තුව" වශයෙන් සඳහන් කරනු ලබන) ආයතනයට පහත සඳහන් කාර්යභාරය ඉටු කිරීමට සුදුසු හා යෝග්‍ය නිලධාරීන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ හා කාර්ය මණ්ඩලය

1. මෙහි මින් මතු "අධ්‍යක්ෂ" වශයෙන් සඳහන් කරනු ලබන ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ මෙහි ප්‍රධානියා වන්නේය. ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II පන්තියේ නිලධාරියෙකු විය යුතු අතර, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලබන්නේය. තව ද, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක 02 සඳහා සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු වැනි ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන්නේය. ඔවුන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ නිලධාරීන් විය යුතුය.

2. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පත්කිරීම, ස්ථාන මාරු කිරීම, සේවයෙන් පහ කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ වෙනත් අනුශාංගික කරුණු සම්බන්ධයෙන් 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ විධිවිධාන සහ ඌව පළාත් ආණ්ඩුකාරවරයා සහ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන බලතල පැවරීම අදාළ වන්නේය.

දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

4. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සහ කර්තව්‍යන් පහත සඳහන් පරිදි වේ.

1. දිළිඳු පවුල් සඳහා මහජනාධාර මාසික දීමනා ගෙවීම්.

2. අමාත්‍යවරයා විසින් මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ පනවනු ලබන නියෝගයක් මගින් තීරණය කරනු ලබන රෝගාබාධ ඇති දිළිඳු තැනැත්තන් වෙත ආධාර ගෙවීම.

3. අනියම් වශයෙන් ආපදාවලට ලක්වී අනාථ භාවයට පත් වූ තැනැත්තන්ට සහ පවුල්වලට සහන සැලසීම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

4. පවුලේ හා සමාජයේ රැකවරණය අහිමි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස හා රැකවරණ මධ්‍යස්ථාන හෝ එවැනි ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන් පුනරුත්ථාපනය කිරීම.

5. සමාජයේ රැකවරණ අවශ්‍ය මනස සෙමෙන් වැඩෙන දරුවන් සහ කායික ආබාධ සහිත දරුවන් සඳහා රැකවරණ නිවාස හෝ ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන් සඳහා විශේෂිත පාසල් හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම මගින් ඔවුන් පළාතේ සංවර්ධනයට දායක කරවීම සහ පුනරුත්ථාපනය කිරීම.

6. ශ්‍රව්‍ය, දෘශ්‍ය හා කථන ආබාධ සහිත දරුවන් සඳහා අවශ්‍ය විශේෂිත පාසැල් පිහිටුවා ඔවුන්ගේ අධ්‍යයන කටයුතු යථා පරිදි පවත්වාගෙන යාම, ඔවුන්ගේ රැකවරණය සඳහා නිවාස හෝ ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ ඔවුන්ට අවශ්‍ය අධ්‍යාපනය ලබා දීම හා වෘත්තීය පුහුණුව ලබා දී ඔවුන් පළාතේ සංවර්ධනයට දායක කරවීම.

7. දැනට නේවාසිකව සිටින සහ සමාජයේ රැකවරණය අහිමව අසරණව සිටින ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ විවිධ ආබාධ සහිත දරුවන් පවුලේ රැකවරණය සඳහා යොමු කිරීමේ වැඩසටහන් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

8. (I) ත්‍රස්තවාදී ක්‍රියාවන් හෝ වාර්ගික ක්‍රියාවන් හේතුවෙන් මරණයට පත්වන තැනැත්තෙකු වෙනුවෙන් පවුලේ ආදායම නොසලකා උපරිමයකට යටත්ව විෂයභාර අමාත්‍යවරයා විසින් නියෝග මගින් තීරණය කරනු ලබන මුදලක් ගෙවීමට කටයුතු කිරීම.

(II) ත්‍රස්තවාදී ක්‍රියාවන් හෝ වාර්ගික ක්‍රියාවන් හේතුවෙන් හෝ ඉතා සුවිශේෂී අවස්ථාවකදී හෝ ස්වාභාවිකව සිදු වන විස්තීර්ණ ආපදාවන් හේතුවෙන් ආබාධිත තත්ත්වයට හා අනාථභාවයට පත් වන තැනැත්තන් සඳහා අවශ්‍ය උපකරණ සහ සහන ඌව පළාතේ සමාජ සුභසාධන අමාත්‍යාංශය භාර ලේකම්ගේ අනුමැතිය මත පවුලේ ආදායම නොසලකා ලබා දීමට කටයුතු කිරීම.

9. සහන අපේක්ෂා කරන දිළිඳු පවුල්වල සිටින ආබාධ සහිත පුද්ගලයින්ට ඇස් කණ්නාඩි, ශ්‍රවන උපකරණ, රෝද පුටු, තෙසිකල්, අත්වාරු, කිහිලිකරු ආදි උපකරණ සැපයීම සහ අක්ෂිකාච සැපයීම.

10. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හෝ සුළු ආබාධ සහිත පුද්ගලයින් නේවාසිකව තබාගෙන ඔවුන් රැකබලා ගන්නා ලියාපදිංචි වී සිටින ස්වේච්ඡා සංවිධාන හෝ ආයතන සඳහා නඩත්තු ආධාර සහ යථායෝග්‍යාධාර ලබාදීම, එවැනි සේවා සපයන ආයතන සංවර්ධනය සඳහා ආධාර ලබාදී එම ආයතන අධීක්ෂණය කිරීම.

11. සමාජයීය වශයෙන් අසරණ භාවයට පත්ව සිටින හා පත්වීමට ඉඩ ඇති පවුල් හෝ තැනැත්තන් හඳුනාගෙන ඔවුන් සඳහා පුනරුත්ථාපන සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

12. සමාජයේ විවිධ හේතූන් නිසා මානසිකව පීඩාවට ලක් වූ හෝ ලක්වීමට ඉඩ ඇති තැනැත්තන් හෝ පවුල් සඳහා උපදේශක සේවා සැපයීම, එමඟින් ඔවුන් පුනරුත්ථාපනය කිරීම හා ඒ සඳහා උපදේශන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

13. ඉහත 2 වගන්තියේ අරමුණු වලට අදාළ විශේෂ අධ්‍යයන, සමීක්ෂණ හා පර්යේෂණ පැවැත්වීම සහ සමාජ විරෝධි ක්‍රියා අවම කිරීම සඳහා වැඩසටහන්, සම්මන්ත්‍රණ පැවැත්වීම හා වැඩසටහන් ක්‍රියාත්මක කර පසු විපරම් කිරීම.

14. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා ආබාධ සහිත තැනැත්තන් සිටින පවුල් වල සාමාජිකයින්, සිරගත වූ අයගේ පවුල්වල සාමාජිකයින්, වැන්දඹු හා අවිවාහක ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, සමාජයේ රැකවරණය අහිමි අසරණව සිටින අයගේ පවුල් වල සාමාජිකයින් හා පාසල් ළමුන් ඇතුළු සමාජයේ තරුණ පිරිස් අරඹයා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් සමාජ සාරධර්ම සුරක්ෂිත කිරීම සහ සමාජ සංවර්ධනය උදෙසා වැඩසටහන් සම්පාදනය කිරීම මඟින් මානසික, ආර්ථික හා සමාජයීය වශයෙන් ඔවුන් ශක්තිමත් කිරීම.

දෙපාර්තමේන්තුවේ බලතල

5. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කාර්යයන් හා අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන තොරතුරු හෝ වාර්තා සමාජ සේවා අධ්‍යක්ෂ විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන අයෙකු විසින් යම් ආයතනයකින් හෝ පුද්ගලයකු විසින් ඉල්ලා සිටියහොත් ඔහු විසින් හෝ එම ආයතනය විසින් අධ්‍යක්ෂ වෙත එම තොරතුරු ලබා දිය යුතුය.

(2) ඌව පළාත තුළ පවත්වාගෙන යනු ලබන ඕනෑම ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසයකට, ආබාධ සහිත පුද්ගලයින් සඳහා පවත්වාගෙන යන නිවාසයකට හෝ සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ආයතනයකට සමාජ සේවා අධ්‍යක්ෂ විසින් හෝ සමාජ සේවා අධ්‍යක්ෂ විසින් බලය පවරන ලද යම් නිලධාරියකුට කලින් දැනුම් දීමකින් තොරව ඇතුල්වීමට හා මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා යම් පරීක්ෂා කිරීමක්, විභාග කිරීමක් විමර්ශනය කිරීමක් හෝ සමීක්ෂණයක් පැවැත්වීමට එම කාර්ය සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි ලේඛන පරීක්ෂා කිරීම, තොරතුරු ලබා ගැනීම, අවශ්‍ය ලිපි ලේඛන ලබා ගැනීම ඇතුළු ඕනෑම නිත්‍යානුකූල අධීක්ෂණ කටයුත්තක් කිරීමට බලය ඇත.

පවත්වාගෙන යනු ලබන නිවාස ආයතන ලියාපදිංචි විය යුතු බව

6. අංක 04 වගන්තිය යටතේ දැක්වෙන කාර්ය භාරය ඉටු කිරීම සම්බන්ධයෙන් ඌව පළාත තුළ ස්වේච්ඡාවෙන් පවත්වාගෙන යනු ලබන නිවාස හා සේවා සපයනු ලබන ආයතන සියල්ල ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතු අතර, විදේශීය රාජ්‍ය නොවන සංවිධාන මගින් පවත්වාගෙන යනු ලබන නිවාසයක් හෝ ආයතනයක් නම් සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශයේ රාජ්‍ය නොවන සංවිධාන ලියාපදිංචි කිරීමේ මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීමෙන් අනතුරුව ඌව පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය.

ඌව පළාත් සමාජ සේවා අරමුදල් ගිණුම

7. මෙම ප්‍රඥප්තියේ 02 වැනි ඡේදයේ සඳහන් අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා ඌව පළාත් සමාජ සේවා අරමුදල් ගිණුම නමින් ගිණුමක් ආරම්භ කොට පවත්වාගෙන යා හැකිය.

අරමුදල් ගිණුමේ පරමාර්ථ

(1) මෙම අරමුදල් ගිණුම පිහිටුවීමේ පරමාර්ථය,

(I) පරිවාස හා ළමා රක්ෂක සේවා කාර්යයන් සඳහා සහාය වීම.

(II) අඩු ආදායම්ලාභී ආබාධ සහිත තැනැත්තන් හා උන් හිටිතැන් අහිමි වුවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන්ට මුදලින් හෝ වෙනත් අයුරකින් අධාර කිරීම, දේශීය වශයෙන් ප්‍රතිකාර ලබා ගත නොහැකි අවස්ථාවන්හි දී විදේශ වෛද්‍ය පහසුකම් ලබා දීමට සහය වීම.

(III) ලියාපදිංචි ළමා නිවාස හා ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාස, ආබාධ සහිත තැනැත්තන් හා උන්හිටිතැන් අහිමි වුවන් සඳහා වන නිවාස වලට හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ආධාර සැපයීම.

(IV) ත්‍රස්තවාදී හා ජාතිවාදී ක්‍රියා ඇතිවුවහොත් ඒ නිසා හෝ සුවිශේෂී අවස්ථාවන් හෝ ස්වභාවිකව සිදුවන විශාල ආපදාවක් හේතුවෙන් අසරණභාවයට පත් පුද්ගලයන් හා පවුල් පුනරුත්ථාපනය කිරීම.

(V) හදිසි ආපදා නිසා අසරණභාවයට පත් වන අයට සහාය වීම හා ආධාර කිරීම.

(VI) ආබාධිත දෙමව්පියන්ගේ දරුවන් හෝ ආබාධිත දරුවන්ගේ සහ දිළිඳු සහ අසරණ පවුල් වල දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුත්තකදී අවශ්‍ය උපකාර කිරීම සහ දිළිඳු සහ අසරණ පවුල් වල දරුවන්ගේ මූලික අධ්‍යාපන කටයුතු සඳහා භාරකාර මණ්ඩලය විසින් ගන්නා තීරණ මත මූල්‍යමය ආධාර කිරීම.

(VII) අඩු ආදායම්ලාභි පවුල් වල රෝගීන් සඳහා විශේෂිත රෝග හා ශල්‍ය කර්ම සඳහා අදාල විශේෂඥ වෛද්‍යවරයාගේ වෛද්‍ය සහතික මත ආධාර කිරීම සහ ඒ සඳහා පැවැත්වෙන සායන වලට සහභාගී වීමේදී සහන සැලසීම.

2. අරමුදල් ගිණුම පරිපාලනය කිරීම,

(I) පළාත් සමාජ සේවා අරමුදල් ගිණුම පරිපාලනය කිරීම සඳහා භාරකාර මණ්ඩලයක් පත් කළ යුතුය. එය නිලලත් සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් හා පත්කර ගන්නා නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

(II) ඌව පළාතේ සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයේ ලේකම්, එම අමාත්‍යාංශයේ ගණකාධිකාරී හා ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ නිලලත් සාමාජිකයින් වන අතර, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සමාජ සේවා කාර්යයන් සඳහා උනන්දුවක් ඇති දෙමළ හා මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් එක් එක් සාමාජිකයා බැගින් වේ. (නිලලත් සාමාජිකයින් දෙමළ හා මුස්ලිම් වන අවස්ථාවල දී බෞද්ධ හා ක්‍රිස්තියානි සාමාජිකයින් 02කු ඒ සඳහා පත් කළ යුතුය.)

(III) පත් කර ගන්නා සාමාජිකයන්ගේ නිල කාලය අවුරුදු තුනකි. අවුරුදු තුන අවසානයේ දී එම තැනැත්තන් නැවත පත් කළ හැකිය.

(IV) නිල බලයෙන්ම පළාත් සමාජ සේවා අමාත්‍යාංශයේ ලේකම් භාරකාර මණ්ඩලයේ සභාපති වන අතර පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ ලේකම් වේ. එම අමාත්‍යාංශයේ ගණකාධිකාරී නිල බලයෙන්ම භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරික විය යුතුය.

භාරකාර මණ්ඩලයේ රැස්වීම

(V) භාරකාර මණ්ඩලය අවම වශයෙන් තුන් මසකට වරක්වත් රැස්විය යුතුය.

ගනපූරණය හා යෝජනා සම්මත කිරීම

(VI) (අ) රැස්වීමේ ගනපූරණය සාමාජිකයන් තුන්දෙනෙකු විය යුතුය.

(ආ) පැමිණ සිටින සාමාජිකයන්ගෙන් අඩකට වඩා කැමැත්ත ප්‍රකාශ කර ඇත්නම් මිස මොනයම් හෝ යෝජනාවක් භාරකාර මණ්ඩලය විසින් අනුමත වූවාසේ නොසැලකේ.

රැස්වීම කැඳවීම හා වාර්තා ලබා ගැනීම

(VII) භාරකාර මණ්ඩලයේ රැස්වීම කැඳවීම මණ්ඩලයේ ලේකම්ගේ වගකීම වන අතර, එම රැස්වීම්වල වාර්තා පවත්වා ගැනීම ලේකම් සතු කාර්යයකි.

අරමුදල් ගිණුමේ සංයුතිය

3. මෙම ගිණුමට ලැබෙන මුදල් මෙහි පහත අයුරින් සමන්විත වේ-

(I) රජයෙන් හෝ ඌව පළාත් සභාවෙන් ලැබෙන ආධාර මුදල්

(II) පුද්ගලයන්ගෙන් හා සංවිධාන වලින් ලැබෙන ආධාර

(III) ශ්‍රී ලංකා රජය මගින් ලැබෙන විදේශ ආධාර

(IV) කරන ලද සේවාවන් වෙනුවෙන් ලැබෙන වෙනත් ආධාර

(V) සංදර්ශන, ලොතරැයි හා වෙනත් සම්මත ක්‍රම වලින් ලබා ගන්නා සියලුම මුදල්

අරමුදලේ ගිණුම්

4. (I) භාරකාර මණ්ඩලයේ භාණ්ඩාගාරික විසින් ගිණුම් පවත්වාගෙන යායුතු අතර, එමගින් පත් කරනු ලබන විගණන නිලධාරි විසින් එම ගිණුම් විගණනයට ලක් කළ යුතුය. එහිදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තිය මෙහි විගණනය සඳහා අදාල විය යුතුය.

(II) මෙම ගිණුමේ මුදල් වර්ෂය සෑම වසරම ජනවාරි 01 සිට දෙසැම්බර් 31 වනදා දක්වා විය යුතුය.

අරමුදල් පිළිබඳ නීති

5. අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විෂය භාර ඇමතිවරයා විසින් නියෝග මගින් සුදුසු ව්‍යවස්ථාවක් සම්පාදනය කරනු ඇත.

භාරකාර මණ්ඩලය පත් කිරීම

6. මණ්ඩලයේ යම් සාමාජිකයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වුවහොත් හෝ එවැනි තනතුරකට පත් වුවහොත් එසේ පත් වන දින සිට එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට නුසුදුස්සකු වන්නේය.

7. මෙම මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු යම් උසාවියක දී වැරදි කරුවෙකු වේ නම් හෝ යම් විෂමාචාර ක්‍රියාවක් හෙළිදරව් වීම හේතුවෙන් හෝ වැරදි කරුවෙකු වුවහොත් විෂයභාර අමාත්‍යවරයා විසින් එම තැනැත්තා සාමාජිකත්වයෙන් ඉවත් කළ යුතුය.

## II කොටස

### වරදවල් හා දණ්ඩන

8. යම් තැනැත්තෙකු, මෙම ප්‍රඥප්තියේ නියමයන් හෝ ඒ යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩ කිරීම හෝ පැහැර හැරීම හෝ නොසලකා හැරීම හෝ මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව යම් කාර්යයන් පැවරී ඇති තැනැත්තෙකුට එම කාර්යය කිරීමට අවහිර කිරීම හෝ මෙහි දක්වා ඇති සේවාවන් ලබා ගැනීම සඳහා සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හෝ කළහොත් ඒ තැනැත්තා මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරුවෙකු වන්නේය.

1. මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන සෑම තැනැත්තෙකුටම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලැබූ ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලබන කල්හි රු. 5000/-ක දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කිරීම හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතුය.

2. මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන යම් නියෝගයක් කඩ කිරීම හෝ පැහැර හැරීම හෝ නොසලකා හැරීම හෝ මෙම ප්‍රඥප්තිය හෝ ඒ යටතේ පනවන නියෝග අනුව ක්‍රියාත්මක නොවන යම් ආයතනයක් ඇත්නම් එම ආයතනයේ ක්‍රියාකාරීත්වය අමාත්‍යවරයා විසින් අත්හිටු විය යුතුය.

## III කොටස

### පොදු විධිවිධාන

9. නියම කළ යුතු යැයි මෙම ප්‍රඥප්තිය මගින් නියමිත, නියෝග සෑදීමට මෙම ප්‍රඥප්තිය මගින් බලය දී ඇති, අවශ්‍ය විය හැකි සියලුම කාරණා සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකිය. *අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි බව*

1. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එය පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍යවරයා විසින් සකස් කරන ලද සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ දින සිට මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව අනුමත කළ පසු ඒ බවද, අනුමත නොකළේ නම් ඒ බවද සඳහන් දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. එසේ පළ කිරීමේදී එම නියෝග යටතේ පෙර කරන ලද කාර්ය හා කර්තව්‍යයන්ට හානියක් නොවන පරිදි පෙර නියෝගය පරිච්ඡින්න වූවා සේ සැලකිය යුතුය.

2. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

10. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටු වන ලද ආයතනවල නඩත්තුව උදෙසා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම හා වැය කිරීම සම්බන්ධයෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන අදාළ වන්නේය. *මූල්‍ය ප්‍රතිපාදන*

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියේ:

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයා ද,

"අමාත්‍යාංශ ලේකම්" යන්නෙන් ඌව පළාත් සභාවේ සමාජ සුභසාධන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් ද,

"අධ්‍යක්ෂ" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනත යටතේ ඌව පළාතට පත් කර ඇති සමාජ සේවා අධ්‍යක්ෂ ද,

"අනියම් ස්වභාවයේ ආපදා" යන්නෙන් පුළුල්ව පැතිරී නොගිය පුද්ගලයෙකුට පාලනය කරගත නොහැකි හේතු නිසා සිදුවන ස්වභාවික සුළු හානි ද,

"ආබාධිත" යන්නෙන් දෙඅත් විකලාංග බව, දෙපාවල විකලාංග බව, ගොළු බව, බිහිරි බව, මන්ද මානසික බව, යන තත්ත්වයන්ගෙන් යුතු අය ද චලන අපහසුතා හා මානසික අපහසුතාවලින් පෙලෙන අය ද අදහස්වේ.

"දිළිඳු" යන්නෙන් ස්වකීය ජීවනෝපාය සඳහා එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික අවශ්‍යතා වෙනුවෙන් ආධාර නොලැබුනහොත් ජීවිතය පවත්වාගෙන යාමට නොහැකි යැයි සැලකෙන අය අදහස්වේ.

"අරමුදල් ගිණුම" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ 7 වැනි වගන්තිය යටතේ පිහිටවනු ලබන අරමුදල් ගිණුම ද,

"මහජනාධාර" යන්නෙන් ආදායම් මාර්ගයක් නොමැති දිළිඳු වයෝවෘද්ධ, රෝගී, ශාරීරික හෝ මානසික ආබාධ සහිත පුද්ගලයින් සඳහා මාසිකව දෙනු ලබන ප්‍රදානයක් යන්න ද,

"ස්වේච්ඡා" යන්නෙන් පුරවැසි කණ්ඩායම් විසින් ප්‍රතිලාභ නොසලකා, සමාජ සංවර්ධනය සඳහාම පිහිටුවන ලද්දා වූ ද, ආණ්ඩුවේ නොවන ස්වභාවයක් ඇත්තා වූ ද ස්වකීය කර්තව්‍යයන් කරගෙන යෑමෙ දී මහජන සම්මාදම් මුදල්, දායක මුදල් ආණ්ඩුව විසින් ගෙවනු ලබන ආධාර මුදල් හා දේශීයද විදේශීය පරිත්‍යාග මත යැපෙන්නන් ද මානසික හෝ ශාරීරික දුබලතාවයකට පත් වූවන්, දිළින්දන්ද, අනාථයින් හා අසරණයින් සඳහා අවශ්‍ය වන සහනාධාර සහ බාහිර හා නේවාසික සේවාවන් සැපයීමේ ද,ස්වභාවික ව්‍යසනවලදී සහනාධාර සැපයීම ද ස්වකීය ප්‍රධාන අරමුණු ලෙස ඇත්තා වූ ද යම් සංවිධානයක් අදහස් වේ.

12. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුව හොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය. *අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.*

---

02-49/4

**ඌව පළාතේ පළාත් සභාව**

**ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 09 දරන ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීමේ සංශෝධිත ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාතේ, පළාත් සභාව විසින් 2010 නොවැම්බර් මස 09 වැනි දින සම්මත කරන ලදුව, 2010 දෙසැම්බර් 24 වැනි දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙහි පළ කරමි.

කේ. ඩී. සිරිසේන,
පළාත් සභා ලේකම්,
ඌව පළාත් සභාව.

2011 ජනවාරි මස 03 වැනි දින,
බදුල්ල රජ වීදියේ පිහිටි,
ඌව පළාත් සභා ලේකම් කාර්යාලයේ දී ය.

**ඌව පළාතේ පළාත් සභාව**

**ඌව පළාතේ, පළාත් සභාවේ 2010 අංක 09 දරන ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීම් සංශෝධිත ප්‍රඥප්තිය**

ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීම පිණිස විධිවිධාන සැලැස්වීම පිණිස වන 2002 අංක 01 දරන පළාත් සභා වැටුප් හා දීමනා ගෙවීම් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වන ප්‍රඥප්තියයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

01. මෙම ප්‍රඥප්තිය 2010 අංක 9 දරන ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට හා එහි සාමාජිකයින්ට වැටුප් හා දීමනා ගෙවීමේ සංශෝධිත ප්‍රඥප්තිය, යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණු දින සිට ක්‍රියාත්මක වන්නේය.

ඌව පළාතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට සහ සාමාජිකයන්ට ගෙවනු ලබන වැටුප් හා දීමනා

02. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සහ ඉන්පසුව,

(අ) ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මාසික දීමනාව වශයෙන් රුපියල් පහළොස් දහසක් (රු. 15,000/-) ද,

(ආ) ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙකුගේ මාසික දීමනාව වශයෙන් රුපියල් දසදහසක් (රු. 10,000/-) ද විය යුත්තේ ය.

වැටුප් හා දීමනා ගෙවීම පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය.

03. මෙම ප්‍රඥප්තිය යටතේ ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ගෙවනු ලබන දීමනා ඌව පළාතේ පළාත් සභා අරමුදලට වැය බරක් වන්නේය.

අනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

---

02-49/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.